සීඒ/6/1/2/5-1 2024.07.25

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,

චක්‍රලේඛ/2024/03

සියලුම සංස්කෘතික මධ්‍යස්ථාන භාර නිලධාරීන් වෙත,

**අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිභා සංගීත (ගායන/වාදන) තරඟාවලිය - 2024**

**සංගීත තරඟාවලිය**

**හැඳින්වීම.**

දැයේ දූ දරුවන් සෞන්දර්ය අධ්‍යාපනයට නැඹුරු කරමින් ඔවුන්ගේ කලා කුසලතා වර්ධනය කරවීම මඟින් සංවේදී සුචරිතවත් අනාගත පරපුරක් බිහිකරලීමේ අරමුණෙන් ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගෙන පවත්වන සුවිශේෂී වැඩසටහනකි.

**01.අරමුණ**

i සිසු පරපුරෙහි රසඥතාව වර්ධනය කරවීම.

ii සිසුන්ගේ නිර්මාණාත්මක කුසලතා වර්ධනය කරවීම හා ඒ සඳහා වේදිකාව විවර කරවීම.

iii සංස්කෘතික මධ්‍යස්ථාන වල කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම හා ඇඟයීමට අවස්ථාව ලබා දීම.

**02.උපදෙස්**

i. ඉදිරිපත්වන සෑම තරඟකරුවෙක්ම තරඟ පවත්වන දිනය වන විට සංස්කෘතික මධ්‍යස්ථානයේ ලියාපදිංචි වී අවම වශයෙන් මාස හතරක් ඉක්මවා තිබිය යුතු අතර, ඔවුන්ගේ පාඨමාලා සඳහා සහභාගීත්වය 80% අනිවාර්යය වේ.

ii. තරඟ පැවැත්වෙන දිනයන් ආසන්නයේ හෝ වෙනත් ආයතනයක සිසුන් ලියාපදිංචි කර තරඟ සඳහා ඉදිරිපත් කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.

iii. තරඟවලට සහභාගී වීමේදී මධ්‍යස්ථානවල ලියාපදිංචි වී නොමැති සිසුන් ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් එම තරඟය අවලංගු කරනු ලබන අතර ව්‍යාජ තොරතුරු සැපයීම සම්බන්ධයෙන් මධ්‍යස්ථාන නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කරනු ඇත. එමෙන් ම තරඟ අවලංගු කරනු ලබන මධ්‍යස්ථානයකට ශූරතාව හෝ අනුශූරතාව අහිමි වනු ඇත.

iv. පළාත් මට්ටමේ හා ජාතික මට්ටමින් අදියර දෙකක් යටතේ තරගාවලිය පවත්වන අතර පළාත් තරගයේදී ලකුණු 50 හෝ 50ට වැඩි පළමු ස්ථාන ලබා ගන්නා තරග ශීර්ෂ පමණක් ජාතික තරගය සඳහා සුදුසුකම් ලබනු ඇත.

v. පළාත් වටයෙහි තරග අංශයන් සඳහා සහභාගී වී ජයග්‍රහනය කරනු ලබන කණ්ඩායම් වල සාමාජික සිසුන් පමණක් ජාතික වටයේ තරග සඳහා ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. ජාතික තරගය සඳහා වෙනත් සිසුන් කණ්ඩායම්වලට ඇතුලත් කිරීම තරගයෙන් ඉවත් කිරීමට හේතුවේ.

vi. තරග විනිශ්චය සඳහා චක්‍රලේඛය සමග යාකොට ඇති ලකුණු ලබාදීමේ පටිපාටිය උපයෝගී කරගනු ඇත. කිසිදු තරග ශිර්ෂයක් සඳහා සම ස්ථාන ලබා දෙනු නොලැබේ.

vii. පළාත් තරගය පැවැත්වෙන දිනය වන විට යොමු කරන ලද නාමලේඛනයෙහි නම් වෙනස් වන්නේ නම් ඒ බව පිළිගත හැකි හේතු සමග විෂය භාර අතිරේක ලේකම් හෝ එම අංශයෙහි මාණ්ඩලික නිලධාරියකු දැනුවත් කර පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

viii. ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු අවසාන දිනය 2024.08.09 වේ. එදිනට පෙර ඉල්ලුම් පත්‍රය සාමාන්‍ය තැපැල/ ලියාපදිංචි තැපැල/ අතින් ගෙනවිත් ප්‍රවර්ධන අංශයට භාරදිය යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

ix. සංගීත නර්තනය යන දෙඅංශයම මධ්‍යස්ථානයෙහි ක්‍රියාත්මක වන්නේ නම් එම දෙඅංශයෙන්ම තරග ශීර්ෂයන්ට සිසුන් ඉදිරිපත් කල යුතුය.

x. කිසිදු තරගයකට ඉදිරිපත්නොවූ සංස්කෘතික මධ්‍යස්ථානවල සම්පත්දායක දීමනා නවතා දැමීමට කටයුතු කරනු ඇත.

xi. ජාතික හැඳුනුම්පත / තැපැල් හැඳුනුම්පත / උප්පැන්න සහතිකයෙහි ඡායාපිටපතක් ඡායාරූපය සමග අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

xii. තරගාවලියට අදාල චක්‍රලේඛය සම්බන්ධයෙන් යම් ගැටළුවක් ඇති වුවහොත් ඒ පිළිබඳව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝ බලය පැවරූ අතිරේක ලේකම් ගේ (ප්‍රවර්ධන) තීරණය අවසන් තීරණය වේ. එම තීරණ අභියෝගයට ලක් කළ නොහැකි ය.

## 03. තරග කොන්දේසි.

සමස්ත තරගාවලියෙහි වයස් සීමාවන් පහත පරිදිවේ.

i. ප්‍රාථමික අංශය වයස අවු : 11 ට අඩු විය යුතුය (උපන් දිනය 2013.07.01 දින හෝ ඊට පසු යෙදී තිබිය යුතුය

ii. කණිෂ්ඨ අංශය වයස අවු : 11 – 15 ත් අතර විය යුතු අතර ( උපන් දිනය 2009.06.30 සිට 2013.06.30 දක්වා ( දෙදිනද ඇතුලත්ව) යෙදී තිබිය යුතුය

iii. ජොෂ්ඨ අංශය වයස අවු : 15 -20 ත් අතර විය යුතු අතර ( උපන් දිනය 2004.06.30 සිට 2009.06.29 දක්වා (දෙදිනද ඇතුලත්ව) යෙදී තිබිය යුතුය .

iv. තරඟ සඳහා වයස් සීමා ගණනය කිරීම 2024.06.30 දිනට සලකනු ලැබේ.

v. එක් මධ්‍යස්ථානයකින් වයස් බාණ්ඩ දෙකම නියෝජනය වන පරිදි (කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ) තරඟ ශීර්ෂ තුනක් ඉදිරිපත් කල හැකිය. ඒ අනුව ඒකල තරඟ ශීර්ෂ දෙකක් ද සමූහ තරඟ ශීර්ෂ එකක් ද වශයෙනි.

vi. එක් ශිෂ්‍යයකුට සහභාගී විය හැක්කේ ඒකල තරඟ ශීර්ෂ එකකට පමණි.

උදා - ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) කණිෂ්ඨ

ගායනය (හින්දුස්ථානි) - ගැහැණු (ඒකල)

හෝ

වාදනය (හින්දුස්ථානි) - ගැහැණු -වයලින් (ඒකල)

vii. එකම දිනක තරග පැවැත්වෙන බැවින් තරග අංග වලට බාධා නොවන පරිදි සිසුන් තෝරාගත යුතුය.

viii. අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ශිෂ්‍ය අනන්‍යතාවය පැහැදිලි කර ගැනීම සඳහා ලියාපදිංචි ලේඛනය ඉදිරිපත්කල යුතුය.

ix. අනන්‍යතාවය තහවුරු කිරීමට නොහැකි තරගකරුවන් සිටියහොත් ජයග්‍රහනය කල ද අවලංගු කරනු ලැබේ.

x. ජාතික තරග වටයේදී නියමිත ඇඳුම් කට්ටලයකින් සැරසී ඉදිරිපත් විය යුතුය.

xi. පෙර වසර වලදී ප්‍රතිභා තරඟ සඳහා නිර්මාණය කල නිර්මාණ ඉදිරිපත් නොකල යුතුය.

xii. එමෙන්ම ප්‍රතිභා තරග සඳහා නිර්මාණය කරන නිර්මාණ ගී පද ජාති, ආගම්,කුලභේද වලට හෝ පටු දේශපාලනික අදහස් උදහස් වලට තුඩු නොදෙන, එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතුය.

xiii. ජාතික හා පළාත් වටයේ සහතික පත්‍ර පිරිනැමීම ලකුණු 50ක් ලබාගත් ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන සඳහා පමණි. ජාතික තරඟාවලියේදී ලකුණු 80ට වැඩියෙන් ප්‍රථම ස්ථානය හිමිකරගන්නා තරඟ අංශය සඳහා පමණක් සම්මානයක් හෝ පදක්කමක් හිමිවේ.

xiv. තරග නීතිරීති උල්ලංඝනය කිරීම පිළිබඳව ගැටළු ඇතිවුවහොත් ඒ අවස්ථා වලදී විධිමත් පරීක්ෂණයකින් පසුව අදාල තරග ප්‍රතිඵල අත්හිටුවීමට, සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට ප්‍රතිඵල ලේඛන වලින් ඉවත් කිරීම හෝ අමාත්‍යාංශ ලේකම් ගේ උපදෙස් මත විෂයභාර මාණ්ඩලික නිළධාරීන්ට සිදු කල හැකිය.

xv. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී තරග ශීර්ෂ සඳහා වෙන වෙනම අයදුම් කිරීමට කටයුතු කරන්න.

xvi. හින්දුස්ථානි, කර්ණාටක හා සාම්ප්‍රදායික ජන ගායනා, බටහිර හා නාට්‍ය ගීත අංශ ( නාඩගම්, නූර්ති හා නව නාට්‍ය) අතරින්අවම එක් තරග ශීර්ෂයක් හෝ උපරිම වශයෙන් තරග ශීර්ෂ 3 ක් නියෝජනය වන පරිදි ඉදිරිපත් කළ හැකිය.

## 04. <u>තරඟ ශිර්ෂ</u>

### <u>01. ශාස්ත්‍රීය අංශය</u>

ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) කණිෂ්ඨ

1. ගායනය (හින්දුස්ථානි) - ගැහැණු (ඒකල)
2. ගායනය (හින්දුස්ථානි) - පිරිමි (ඒකල)

- නිර්දේශිත රාග බිලාවල්/යමන්/කාෆි/ඛමාජ්
- ඛ්‍යාල් ගායනා ශෛලියට අයත් ගායනා තෝරාගත යුතුය.
- පූර්වාලාප, ඛ්‍යාල් මධ්‍යාලාප, තානාලංකාර සහිතව ඉදිරිපත් කළ යුතුය.
- තාල සහ ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා අදාල සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ යුතු වේ.
- තරගකරුවෙකු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 05 හා උපරිම විනාඩි 07ක් විය යුතුය.

3. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - වයලින් (ඒකල)
4. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - බටනලා (ඒකල)
5. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - එස්රාජ් (ඒකල)
6. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - සිතාර් (ඒකල)
7. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - ගිටාර් (ඒකල)
8. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - හාර්මෝනියම් (ඒකල)
9. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - වයලින් (ඒකල)
10. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - බටනලා (ඒකල)
11. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - එස්රාජ් (ඒකල)
12. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - සිතාර් (ඒකල)
13. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - ගිටාර් (ඒකල)
14. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - හාර්මෝනියම් (ඒකල)

- නිර්දේශිත රාග බිලාවල්/යමන්/කාෆි/ඛමාජ්
- සාම්ප්‍රදායට අනුකූල වන පරිදි සුදුසු මාධ්‍යාලය ඛ්‍යාල් ගායනා ශෛලියට අයත් ගායනයක් හෝ ගත් වාදිතයක් ඉදිරිපත් කළ යුතුය.
- තාල සහ ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා අදාල සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ යුතු වේ.
- තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 05ක් හා උපරිම විනාඩි 07ත් අතර විය යුතුය.

15. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - තබ්ලාව
16. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - තබ්ලාව
    - නිර්දේශ තාලය - ත්‍රිතාල් / ජප් තාලය
    - තාලයට අදාළ පරිදි වාදනයේ දී අන්තර්ගත විය යුතු සියලුම පද වර්ගයන් පිළිවෙලින් සකස් වූ වාදනයක් විය යුතුය.
    - විලම්භ ලයෙන් ආරම්භ කර මධ්‍යාලය සහ ධ්‍රැත ලය දක්වා වාදනය
    - කායදා ( ගුණ කිරීම් අනුව), පල්ටා,රෙහෙලා, ගත්, ටුකුඩා, මුකුඩා, තිහායි, චක්‍රදාර් පරන් ආදී ශිල්ප ක්‍රම ඇතුලත් කර ගත හැකිය.
    - නිවැරදි වාදන ඉරියව් සහ හස්ත වාදන පිළිබඳ අවධානය යොමු විය යුතුය.
    - සමස්ත වාදනය නිවැරදි ලෙහෙරාව සමග අනුගත විය යුතුය.
    - කාලය අවම විනාඩි 5 ත් උපරිම විනාඩි 7 ත් අතර විය යුතුය.
    - වාදකයා ඇතුලුව උපරිම 3 ක් සහභාගී කර ගත හැකිය. ( ලෙහෙරාව සහ තාම්පුරා වාදනය සඳහා )

17. ගායනය (කර්ණාටක) - ගැහැණු (ඒකල)
18. ගායනය (කර්ණාටක) - පිරිමි (ඒකල)

- නිර්දේශිත රාග - කල්‍යාණී /මෝහනම්/ කරහරප්‍රිය/ හරිකාම්බොජී

- තෝරාගත් රාගයට අදාල කීර්තනම් ගායන අංගයක් ඉදිරිපත් කළ යුතුය.
- තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 05ත් විනාඩි 07ත් අතර විය යුතුය.
- තාල සහ ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා අදාල සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ යුතු වේ.

19. වාදනය (කර්ණාටක) - ගැහැණු - වීණාව (ඒකල)
20. වාදනය (කර්ණාටක) - ගැහැණු - වයලින් (ඒකල)
21. වාදනය (කර්ණාටක) - ගැහැණු - බටනලා (ඒකල)
22. වාදනය (කර්ණාටක) - ගැහැණු - නාදස්වරම් (ඒකල)
23. වාදනය (කර්ණාටක) - ගැහැණු - හාර්මෝනියම් (ඒකල)
24. වාදනය (කර්ණාටක) - පිරිමි - වීණාව (ඒකල)
25. වාදනය (කර්ණාටක) - පිරිමි - වයලින් (ඒකල)
26. වාදනය (කර්ණාටක) - පිරිමි - බටනලා (ඒකල)
27. වාදනය (කර්ණාටක) - පිරිමි - නාදස්වරම් (ඒකල)
28. වාදනය (කර්ණාටක) - පිරිමි - හාර්මෝනියම් (ඒකල)
    - නිර්දේශිත රාග/කරහරප්‍රිය/මේජකල්‍යානි/හනුමන්තෝඩි/ / හරිකම්බොජි
    - තෝරාගත් රාගයට අයත් කීර්ත නම් ගායන අංගයක් ඉදිරිපත් කළ යුතුය.
    - ශෛලියට අදාළ ශාස්ත්‍රිය ගායන අංග ඇතුළත් විය යුතුය.
    - තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
    - කාලය අවම විනාඩි 05ත් 07ත් අතර විය යුතුය.
    - ශෛලියට අනුව සහය වාදන භාණ්ඩ යොදා ගත යුතුය.

29. වාදනය (කර්ණාටක) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - මෘදංගම්
30. වාදනය (කර්ණාටක) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - සටම්
31. වාදනය (කර්ණාටක) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - මෘදංගම්
32. වාදනය (කර්ණාටක) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - සටම්
    - නිර්දේශිත තාලය - රූපක තාලම් /ආදි තාලම්
    - තාලයට අදාල පරිදි වාදනයේදී අනතර්ගත සියලුම පද වර් පිළිවෙලින් සකස් වූ තාල වාදනයක් විය යුතුය.
    - සාම්ප්‍රදායික වාද්‍ය ශිල්ප ක්‍රම භාවිතා කළ යුතුය.
    - කාලය අවම විනාඩි 5 ත් උපරිමය විනාඩි 7 ත් අතර විය යුතුය.
    - සහය වාදන ශිල්පියකු යොදා ගත හැකිය.

**ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) ජොෂ්ඨ**

33. ගායනය (හින්දුස්ථානි) - ගැහැණු (ඒකල)
34. ගායනය (හින්දුස්ථානි) - පිරිමි (ඒකල)
    - නිර්දේශිත රාග යමන්/ භෛරව/ ආශාවරී/ භාගේශ්‍රී
    - ඛ්‍යාල් ගායනා ශෛලියට අයත් ගායනා තෝරාගත යුතුය.
    - පූර්වාලාප, ඛ්‍යාල් මධ්‍යලාප, තානාලංකාර සහිතව ඉදිරිපත් කළ යුතුය.
    - තාල සහ ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා අදාල සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ යුතු වේ.
    - තරගකරුවෙකු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
    - කාලය අවම විනාඩි 10 ත් උපරිම විනාඩි 15 ක් විය යුතුය.
35. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - වයලින් (ඒකල)
36. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - බටනලා (ඒකල)

37. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - එස්රාජ් (ඒකල)
38. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - සිතාර් (ඒකල)
39. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - ගිටාර් (ඒකල)
40. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - හාර්මෝනියම් (ඒකල)
41. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - වයලින් (ඒකල)
42. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - බටනලා (ඒකල)
43. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - එස්රාජ් (ඒකල)
44. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - සිතාර් (ඒකල)
45. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - ගිටාර් (ඒකල)
46. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - හාර්මෝනියම් (ඒකල)

- නිර්දේශිත රාග යමන්/ භෛරව/ ආශාවරී/ භාගේශ්‍රී
- ඛ්‍යාල් ගායනා ශෛලියට අයත් ගායනයක් හෝ ගත් වාදිතයක් විලම්භ ලය, මධ්‍යලය, ධ්‍රැත ලය සහිතව පූර්වාලාප, මධ්‍යාලාප, තානාලංකාර, කඩලා ශාස්ත්‍රීය වාදනයකට අයත් ශිල්ප ක්‍රම භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතුය.
- තාල සහ ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා අදාල සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ යුතු වේ.
- තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 10 ක් හා උපරිම විනාඩි 15 ත් අතර විය යුතුය.

47. වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - තබ්ලාව
48. වාදනය (හින්දුස්ථානි) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - තබ්ලාව

- නිර්දේශ තාලය - ත්‍රිතාල් / ඒක් තාල්
- තාලයට අදාළ පරිදි වාදනයේ දී අන්තර්ගත විය යුතු සියලුම පද වර්ගයන් පිළිවෙලින් සකස් වූ වාදනයක් විය යුතුය.
- විලම්භ ලයෙන් ආරම්භ කර මධ්‍යලය සහ ධ්‍රැත ලය දක්වා වාදනය
- පේෂ්කාර, කායදා ( ගුණ කිරීම් අනුව), රේලා, ගත්, ටුකුඩා, මුකුඩා,පරන්, චක්‍රදාර් ආදී ශිල්ප ක්‍රම ඇතුලත් කර ගත හැකිය.
- නිවැරදි වාදන ඉරියව් සහ හස්ත වාදන පිළිබඳ අවධානය යොමු විය යුතුය.
- සමස්ත වාදනය නිවැරදි ලෙහෙරාව සමග අනුගත විය යුතුය.
- කාලය අවම විනාඩි 7 ත් උපරිම විනාඩි 10 ත් අතර විය යුතුය.
- වාදකයා ඇතුලුව උපරිම 3 ක් සහභාගී කර ගත හැකිය. ( ලෙහෙරාව සහ තාම්පුරා වාදනය සඳහා )
- තාලය පිළිබඳ මනා අවබෝධයකින් ලයකාරී වාදන ඉදිරිපත් කිරීම
- සංකීර්ණ පද කොටස් අන්තර්ගත කර ගනිමින් වාදනය කළ යුතුය.

49. ගායනය (කර්ණාටක) - ගැහැණු (ඒකල)
50. ගායනය (කර්ණාටක) - පිරිමි (ඒකල)

- නිර්දේශිත රාග - කල්‍යාණි/ හම්සද්වනී/ මායාමාලවගෞල/ හේමවතී
- තෝරාගත් රාගයට අදාල කීර්තනම් ගායන අංගයක් ඉදිරිපත් කළ යුතුය.

- රාගාලාප, නිරවල් සහ කල්පනාස්වරම් සහිතව ගායනය ඉදිරිපත් කළ යුතුය.
- තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
- කාලය අවම විනාඩි 10 ත් විනාඩි 15 ත් අතර විය යුතුය.
- තාල සහ ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා අදාල සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ යුතු වේ.

51. වාදනය (කර්ණාටක) - ගැහැණු - වීණාව (ඒකල)
52. වාදනය (කර්ණාටක) - ගැහැණු - වයලින් (ඒකල)
53. වාදනය (කර්ණාටක) - ගැහැණු - බටනලා (ඒකල)
54. වාදනය (කර්ණාටක) - ගැහැණු - නාදස්වරම් (ඒකල)
55. වාදනය (කර්ණාටක) - ගැහැණු - හාර්මෝනියම් (ඒකල)
56. වාදනය (කර්ණාටක) - පිරිමි - වීණාව (ඒකල)
57. වාදනය (කර්ණාටක) - පිරිමි - වයලින් (ඒකල)
58. වාදනය (කර්ණාටක) - පිරිමි - බටනලා (ඒකල)
59. වාදනය (කර්ණාටක) - පිරිමි - නාදස්වරම් (ඒකල)
60. වාදනය (කර්ණාටක) - පිරිමි - හාර්මෝනියම් (ඒකල)
    - නිර්දේශිත රාග - කල්‍යාණි/ හම්සද්වනී/ මායාමාලවගෞල/ හේමවතී
    - තෝරාගත් රාගයට අයත් කීර්තනම් ගායන අංගයක් ඉදිරිපත් කළ යුතුය.
    - රාගාලාප, නිරවල් සහ කල්පනාස්වරම් සහිතව ගායනය ඉදිරිපත් කළ යුතුය.
    - තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.
    - කාලය අවම විනාඩි 10ත් 15ත් අතර විය යුතුය.
    - ශෛලියට අනුව සහය වාදන භාණ්ඩ යොදා ගත යුතුය.

61. වාදනය (කර්ණාටක) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - මෘදංගම්
62. වාදනය (කර්ණාටක) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - සටම්
63. වාදනය (කර්ණාටක) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - මෘදංගම්
64. වාදනය (කර්ණාටක) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - සටම්

    - නිර්දේශීත තාලය - ආදි / බන්ඩචාපු/ මිශ්‍ර චාපු
    - තාලයට අදාල පරිදි වාදනයේදී අනතර්ගත සියලුම පද වර්ග පිළිවෙලින් සකස් වූ තාල වාදනයක් විය යුතුය.
    - සාම්ප්‍රදායික වාද්‍ය ශිල්ප ක්‍රම භාවිතා කළ යුතුය.
    - කාලය අවම විනාඩි 10 ත් උපරිමය විනාඩි 15 ත් අතර විය යුතුය.
    - සහය වාදන ශිල්පියකු යොදා ගත හැකිය.
    - තාල සහ ශ්‍රැතිය පවත්වා ගැනීම සඳහා අදාල සංගීත භාණ්ඩ පමණක් භාවිතා කළ යුතු වේ.
    - තරඟකරු සමඟ සහභාගි විය හැකි උපරිම ගණන 04කි.

<u>**02. (බටහිර) ශාස්ත්‍රීය අංශය - ගායනය /වාදනය (ජ්‍යෙෂ්ඨ).**</u>

65. බටහිර ශාස්ත්‍රීය ගායනය (සමූහ)
    - ප්‍රසිද්ධ පොප් ගායනාවක්
    - ගායනය සඳහා සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 12 වන අතර උපරිම සංඛ්‍යාව 25 කි.
    - හඩතල යොදා ගනිමින් නිර්මාණාත්මක අංගයක් විය යුතුය.
    - සහය වාදනය සඳහා විදුලි ඕගනයක් භාවිතා කල හැක.
    - කාලය අවම විනාඩි 5ක් වන අතර උපරිම විනාඩි 8 කි.
    - සම්පත්දායකයාටද සහභාගී විය හැක.

66. බටහිර ශාස්ත්‍රීය වාදනය (සමූහ)

- නව නිර්මාණාත්මක සමූහ වාදනයක් විය යුතුය.
- තේමාව- වැස්ස,සුළඟ,ආදරය,පරිසරය, අනුවාදනයක් විය යුතුය.
- වාදනය සඳහා සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 10 වන අතර උපරිම සංඛ්‍යාව 25 කි.
- සම්පත්දායකයාටද සහභාගී විය හැක.
- කාලය අවම විනාඩි 8ක් වන අතර උපරිම විනාඩි 15 කි.

## 03. නාට්‍ය ගීත අංශය

67. නාඩගම්,නූර්ති, සහ නව නාට්‍ය ගීත - සමූහ - මිශ්‍ර - කණිෂ්ඨ

68. නාඩගම්,නූර්ති, සහ නව නාට්‍ය ගීත - සමූහ - මිශ්‍ර - ජ්‍යෙෂ්ඨ

- නිර්දේශිත නූර්ති - ශ්‍රී වික්‍රම /විදුර/ හේමමාලා/ දුටුගැමුණු
- නිර්දේශිත නාඩගම් - ඉයුජීන්/ ඩ්‍රම්පෝඩ්/ ඇහැළේපොල/ ජොහානා
- නිර්දේශිත නාට්‍ය- අන්දරේලා/ කුවේණි/ මහගිරිදඹ/ බෙරහඬ
- නාඩගම්, නූර්ති සම්ප්‍රදායට අයත් එක් ගීතයක් හා නව නාට්‍ය ගීතයක් ගායනා කළ යුතුය.
- ශෛලියට උචිත සංගීත භාණ්ඩ පමණක් යොදා ගත යුතුය.
- නවනාට්‍ය ගීත සඳහා පමණක් උචිත පරිදි විද්‍යුත් භාණ්ඩ පමණක් යොදා ගත හැකිය.
- උචිත අංගචලන භාවිත කල හැකිය.
- සහභාගිවිය හැකි සංඛ්‍යාව ගායනය සඳහා අවම වශයෙන් 10 ත් වාදනය සමග උපරිම 25 ත් අතර වේ.
- කාලය උපරිම විනාඩි 15.

**සාම්ප්‍රදායික ජන ගායනා අංශය**

69. ජනගායනා / සිංහල - සමූහ - කණිෂ්ඨ - ගොයම් ගී/ කෙලි ගී/ බෞද්ධ ආගමික ගී

70. ජනගායනා / සිංහල - සමූහ - ජ්‍යෙෂ්ඨ - සී පද/ ශාන්තිකර්ම/ වැලපුම් ගායනා

- බෞද්ධ ආගමික අනාසාතාත්මක ගායනා වලින් සැදුම්ලත් ගායනා
- ශීර්ෂ 3 ටම අදාල වන පරිදි ගීත යොදා ගත යුතුය. උදා- ගොයම් ගීයක්, කෙලි ගීයක්,බෞද්ධාගමික ගීයක්
- කාලය අවම විනාඩි 10 ත් උපරිම විනාඩි 15 ත් විය යුතුය.
- සහභාගී විය හැකි සංඛ්‍යාව උපරිම 20 ක් විය යුතු අතර, ගායක කණ්ඩායම අවම 10, උපරිම 15 ත් විය යුතුය. ( සහය වාදක කණ්ඩායම උපරිම 05 දෙනකු නොඉක්මිය යුතුය).

71. ජනගායනා / දෙමළ / මුස්ලිම් - සමූහ - කණිෂ්ඨ - ජන කෙලි ගී/ කරගම්/ කෝලාට්ටම්

72. ජනගායනා / දෙමළ / මුස්ලිම් - සමූහ - ජ්‍යෙෂ්ඨ - ජන ඇදහිලි ආශ්‍රිත ගායනා

- උක්ත තේමාව යටතේ තෝරාගත් ජන ගී ප්‍රසංගාත්මකව ඉදිරිපත් කළ හැකිය.
- සාම්ප්‍රදායික නාද මාලාවලින් බැහැර නොවිය යුතුය.
- විද්‍යුත් නොවන අනන්‍යය වූ සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ යොදා ගනිමින් ජන ගී ආර රැකෙන පරිදි ඉදිරිපත් කළ යුතුය.

- කාලය අවම විනාඩි 10 ත් උපරිම විනාඩි 15 ත් විය යුතුය.
- සහභාගී විය හැකි සංඛ්‍යාව උපරිම 20 ක් විය යුතු අතර, ගායක කණ්ඩායම අවම 10, උපරිම 15 ත් විය යුතුය. ( සහය වාදක කණ්ඩායම උපරිම 05 දෙනකු නොඉක්මිය යුතුය).

**අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන ජාතික සංගීත තරගාවලිය**

**ප්‍රතිභා 2024**

**තරග විනිශ්චය සඳහා ලකුණු ලබා දීමේ පිළිවෙල**

**01. ශාස්ත්‍රීය අංශය**

ශාස්ත්‍රීය ගායනය / වාදන (ඒකල) කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ

ගායනය (හින්දුස්ථානි) - ගැහැණු (ඒකල)
ගායනය (හින්දුස්ථානි) - පිරිමි (ඒකල)

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සමස්ත ගායනය සහ වාදනය තුළම ශ්‍රැතිය, ස්වර ලය සහ තාලය පවත්වා ගැනීම | 25 |
| 02 | රාගයේ නිවැරදි භාවය | 25 |
| 03 | භාවමය ප්‍රකාශන සහ ශාස්ත්‍රීය ගායනයක ශිල්පීය උපක්‍රම (මූර්කි, කන්, ගමක් ආදී) ඇතුලත් වීම | 25 |
| 04 | සැලසුම් කර ගැනීම සහ ඉදිරිපත් කර ගැනීම | 25 |

වාදනය (හින්දුස්ථානි) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - තබ්ලාව
වාදනය (හින්දුස්ථානි) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - තබ්ලාව
වාදනය (කර්ණාටක) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - මෘදංගම්
වාදනය (කර්ණාටක) - ගැහැණු - තාල වාද්‍ය භාණ්ඩ - සටම්
වාදනය (කර්ණාටක) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - මෘදංගම්
වාදනය (කර්ණාටක) - පිරිමි - තාල වාද්‍ය භාණ්ඩ - සටම්

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | තාල වාද්‍ය භාණ්ඩය නිවැරදිව සුසර කර ගැනීම සහ තාලාක්ෂර නිවැරදි බව | 25 |
| 02 | ලෙහෙරාවට අනුව ලය සහ තාලය පවත්වා ගැනීම | 25 |
| 03 | වාදන අන්තර්ගතය සහ ශිල්ප ක්‍රම භාවිතය | 25 |
| 04 | සංවිධානාත්මක බව, සැලසුම් සහගතව ඉදිරිපත් කිරීම | 25 |

**02. (බටහිර) ශාස්ත්‍රීය අංශය - ගායනය /වාදනය (ජ්‍යෙෂ්ඨ).**

බටහිර ශාස්ත්‍රීය ගායනය (සමූහ)
බටහිර ශාස්ත්‍රීය වාදනය (සමූහ)

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සමස්ත ගායනය සහ වාදනය තුළම ශ්‍රැතිය, ස්වර ලය සහ තාලය පවත්වා ගැනීම | 25 |
| 02 | නිර්මාණාත්මක බවින් සහ ස්වර අලංකාර පෙන්වීම | 25 |
| 03 | ගායනයෙහි තාක්ෂණික බව පෙන්වීම | 25 |
| 04 | සංවිධානාත්මක බව, සැලසුම් කර ගැනීම සහ ඉදිරිපත් කිරීම | 25 |

**03. නාට්‍ය ගීත අංශය**

නාඩගම්,නූර්ති, සහ නව නාට්‍ය ගීත - සමූහ - මිශ්‍ර - කණිෂ්ඨ
නාඩගම්,නූර්ති, සහ නව නාට්‍ය ගීත - සමූහ - මිශ්‍ර - ජ්‍යෙෂ්ඨ

**සාම්ප්‍රදායික ජන ගායනා අංශය**

ජනගායනා / සිංහල - සමූහ - කණිෂ්ඨ
ජනගායනා / සිංහල - සමූහ - ජ්‍යෙෂ්ඨ
ජනගායනා / දෙමළ / මුස්ලිම් - සමූහ - කණිෂ්ඨ
ජනගායනා / දෙමළ / මුස්ලිම් - සමූහ - ජ්‍යෙෂ්ඨ

| අනු අංකය | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | සමස්ත ගායනය තුළම ශ්‍රැතිය, ස්වර ලය සහ තාලය නිවැරදිව පවත්වා ගැනීම | 25 |
| 02 | නිවැරදි ගායනා ශෛලියට අනුගත ආකාරයට ඉදිරිපත් කිරීම | 25 |
| 03 | භාවමය ප්‍රකාශනය, වචන උච්චාරණය, ප්‍රාසාංගික බව | 25 |
| 04 | සංවිධානාත්මක බව, සැලසුම් කර ගැනීම සහ ඉදිරිපත් කිරීම | 25 |

**තිලක් නන්දන හෙට්ටිආරච්චි**

**අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන)**

**අත් කළේ/ එච්.එම්.බී.පී. හේරත්**

**ලේකම්**
**බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

ආදර්ශ අයදුම් පත්‍රය (පළාත්/ජාතික)

සිංහල/ දෙමළ/ මුස්ලිම්

මෙම ආදර්ශයට අනුව අයදුම්පත පිළියෙල කිරීමේදී යතුරු ලියනය හෝ පරිගණකය භාවිතා කරන්නේ නම් ඉතා වැදගත් වේ.

ප්‍රතිභා 2024

අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන සංගීත තරඟාවලිය

01. සංස්කෘතික මධ්‍යස්ථානයේ නම ------------------------------------------------------------

02. සංස්කෘතික මධ්‍යස්ථානයේ ලිපිනය ------------------------------------------------------------

03. දුරකථන අංකය ------------------------------------------------------------

04. සංස්කෘතික මධ්‍යස්ථානය අයත් වන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ------------------------------------------------------------

දිස්ත්‍රික්කය ------------------------------------------------------------

පළාත ------------------------------------------------------------

05. ඉදිරිපත් වන තරඟ ශීර්ෂය හා නම් (චක්‍රලේඛය අනුව සටහන් කරන්න)

තරඟ ශීර්ෂ තරඟ ශිර්ෂය

උදා. 17 ගායනය-කර්නාටක-ගැහැණු-ඒකල

1. -------------------- ------------------------------------------------------------

06. තරඟයට සහභාගී වන අයදුම්කරුවන්ගේ නාම ලේඛනය

(මුලකරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න)

| ලියාපදිංචි අංකය | නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | උපන් දිනය | 2024.06.30 දිනට වයස | අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

07. අතිරේක අයදුම්කරුවන්ගේ නම් (ගායන වාදන හැර)

------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------

08. කණ්ඩායම භාරව පැමිණෙන ගුරු භවතුන්ගේ නම්

---------------------------------------------------------------------------------------------------------------
---------------------------------------------------------------------------------------------------------

09. තරඟය සඳහා වාදනයෙන් හා ගායනයෙන් සහභාගී වන්නේ නම් වෙන වෙනම සටහන් කරන්න.

1. ----------------------------------------------------------------------------------------------------------

2. ----------------------------------------------------------------------------------------------------------

3. ----------------------------------------------------------------------------------------------------------

10. ප්‍රසංග අංගය පුහුණු කළ ගුරු මහතා/මහත්මිය ගේ නම් වෙන වෙනම සටහන් කරන්න.

---------------------------------------------------------------------------------------------------------------
---------------------------------------------------------------------------------------------------------

මෙම තරඟයට සහභාගී වන සියලුම අයදුම්කරුවන් තරඟ ඉසව් වලට අදාළ වයස් සීමාවෙන් තෝරා ගත් බව සහතික කරමි. මෙම චක්‍රලේඛයේ සියලුම කොන්දේසි වලට අනුකූලව තරඟ කිරීමට බැඳී සිටින බවත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගන්නා බවත්, සෑම තරඟ අවස්ථාවකදීම මාගේ සංස්කෘතික මධ්‍යස්ථානයේ සිසුන්/සිසුවියන් විනයානුකූලව හැසිරවීමේ වගකීම පෞද්ගලිකව භාර ගන්නා බවත් සහතික කරමි.

11. ගුරු භවතුන්ගේ නම් අත්සන

------------------------------------------------------------------------ ----------------------------

------------------------------------------------------------------------ ----------------------------

12. ස්ථානභාර සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරියාගේ නම අත්සන

------------------------------------------------------------------------ ----------------------------

නිල මුද්‍රාව

දිනය : --------------------